(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 92.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**

ගරු **(ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

ගරු **ඒ. ඒ. විජේතුංග මහතා**

ගරු **(වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

ගරු **ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

ගරු **රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

ගරු **චමින්ද විජේසිරි මහතා**

ගරු **කංචන විජේසේකර මහතා**

ගරු **විමල් වීරවංශ මහතා**

ගරු **එස්. ශ්‍රීතරන් මහතා**

ගරු **ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

ගරු **ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

ගරු **ජයන්ත සමරවීර මහතා**

ගරු **සන්දිත් සමරසිංහ මහතා**

ගරු **රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ඊ. සරවනපවන් මහතා**

ගරු **එම්. එච්. එම්. සල්මාන් මහතා**

ගරු **ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

ගරු **සිවශක්ති ආනන්දන් මහතා**

ගරු **එම්. ඒ. සුමන්තිරන් මහතා**

ගරු **වඩිවේල් සුරේෂ් මහතා**

ගරු **මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා**

ගරු **විජේපාල හෙට්ටිආරච්චි මහතා**

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

ගරු **කනක හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2016 අගෝස්තු මස 23 වන දින පහත සඳහන් පනත් කෙටුම්පත්වල මවිසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම); සහ

මුල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,—

(i) 2015 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා විසින්, 2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා පිළිගන්වා, එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද "විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් අටක්", "රේගු ආඥා පනත යටතේ යෝජනාවක්" සහ "නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් හතරක්" යන කාරණා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම්** :

(1) අම්බලන්තොට, ගල්ලැලිතොට, රිදියගම පාර, අංක 333/6 දරන ස්ථානයෙහි පදිංචි එන්. සමරවීර මහතාගෙන් ලැබුණු 2016.06.17 දිනැති පෙත්සම ගරු ජෝන් අමරතුංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අංගොඩ, ගොතටුව, නින්දහේන, අංක 561 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. එස්. ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු 2015.10.26 දිනැති පෙත්සම ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මාතලේ, යටවත්ත, වැලිකන්ද නිවස, අංක 1/56 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. බී. රංජනී හිටිබණ්ඩාර මහත්මියගෙන් ලැබුණු 2016.07.09 දිනැති පෙත්සම ගරු වසන්ත අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) කඩවත, සූරියපාළුව, ශ්‍රී සීලවංශ නාහිමි මාවත, අංක 65/කේ දරන ස්ථානයෙහි පදිංචි එස්. නිහාල් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2016.06.29 දිනැති පෙත්සම ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(5) කොළඹ - 10, මාලිගාවත්ත ජාතික මහල් නිවාස, අංක සී 3/20 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඩී. එන්. විනෝදනී මෙනවියගෙන් ලැබුණු 2016.04.19 දිනැති පෙත්සම ගරු බිමල් රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(6) නීර්වේලි, නීර්වේලි බටහිර, මහාසිවම් යන ලිපිනයෙහි පදිංචි ඒ. කන්දසාමි මහතාගෙන් ලැබුණු 2016.06.27 දිනැති පෙත්සම ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) බත්තරමුල්ල, කෙලින් වීදිය, අංක 102/1 දරන ස්ථානයෙහි පදිංචි ජී. එල්. ඒ. කොලොන්නෙ මහතාගෙන් ලැබුණු 2016.04.06 දිනැති පෙත්සම;

(ii) යටියන, පුහුල්හේන, වල්බුලුගහහේන, දොලගාවහේන යන ලිපිනයෙහි පදිංචි එච්. ඒ. ඉන්ද්‍රානි මහත්මියගෙන් ලැබුණු 2016.06.27 දිනැති පෙත්සම; සහ

(iii) කඹුරුපිටිය, කහගල, යොවුන්ගම, අංක 40 දරන ස්ථානයෙහි පදිංචි කේ. එච්. සුනිල් මහතාගෙන් ලැබුණු 2016.06.23 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) බූස්ස, හැගොඩ, මහගොඩ යන ලිපිනයෙහි පදිංචි ජී. එච්. ජී ප්‍රසාද් චමින්ද මහතාගෙන් ලැබුණු 2016.02.06 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(9) මාරවිල, නාත්තන්ඩිය පාර, පරගහවත්ත පාර, "කුසුම්" යන ලිපිනයෙහි පදිංචි එන්. බර්නාඩ් කොස්මන් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2016.02.14 දිනැති පෙත්සම ගරු අශෝක ප්‍රියන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(10) අනුරාධපුර, කහටගස්දිගිලිය, මීමින්නාවල, අඹගහවැව - 213(තුලාන), අංක 83 දරන ස්ථානයෙහි පදිංචි එම්. එම්. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු 2015.12.15 දිනැති පෙත්සම ගරු චන්දිම ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(11) කොළඹ - 04, දුම්රියපල පාර, ඕෂන්වීව් ටවර්, අංක සී 7 දරන ස්ථානයෙහි පදිංචි තිලංගනී හේරත් මහත්මියගෙන් ලැබුණු 2016.06.14 දිනැති පෙත්සම ගරු සිසිර ජයකොඩි මහතා විසින් පිළිගන්වන ලදී.

(12) ඇඹිලිපිටිය, පැරණි කඳවුර, එස්.ඕ.එම්. - 1 (7-8) දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. ඩී. වික්‍රමසේන මහතාගෙන් ලැබුණු 2016.06.24 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

(13) (i) වස්කඩුව, මහවස්කඩුව, ශ්‍රී ධීරානන්ද මාවත, "අරුණ" යන ලිපිනයෙහි පදිංචි ඒ. දර්ශන ෆොන්සේකා මහතාගෙන් ලැබුණු 2016.03.11 දිනැති පෙත්සම; සහ

(ii) බොරලැස්ගමුව, බොරලැස්ගමුව මහා විද්‍යාලයේ සේවය කරන නිමල් වික්‍රමආරච්චි මහතාගෙන් ලැබුණු 2016.01.27 දිනැති පෙත්සම

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු එස්. සී. මුතුකුමාරණ මහතා, ගරු වීරකුමාර දිසානායක මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සැමට සරණ සහන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා, ගරු කේ. කේ. පියදාස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීම

පනත් කෙටුම්පත, සභාවේ අවසර ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

(අ. භා. 3.20 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

**8. සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.25 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.15 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 21 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

22 වැනි වගන්තිය

ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 8 වැනි පිටුවේ 29 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

> "රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයක් යන වචන ආදේශ".

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

23 වැනි වගන්තියේ සිට 26 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**9. කල් තැබීම (ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින දෙමළ ජාතික සිරකරුවන්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(අ. භා. 6.31 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2016 අගෝස්තු මස 24 වැනි බදාදා අ. භා. 1.00 වනතෙක් කල් ගියේය.